# අසරණ ගැහැණු ළමයා



එච්.එම්.රනුදි රමල්යා බණ්ඩාර හේරත්

# අසරණ ගැහැණු ළමයා

**2023**

**කතෘ ප්‍රකාශනයකි**

ISBN: 978-624-206-762-9



**කථාව සහ චිත්‍ර - එච්.එම්.රනුදි රමල්යා බණ්ඩාර හේරත්**

**පාසල - මහාමායා බාලිකා විද්‍යාලය /මහනුවර**

**කතෘගේ වෙනත් කෘති - අරුම පුදුම කඟවේනා**

**2023.11.15**

# පිදුම

මා සෙනෙහසින් හැදුවැඩූ මාගේ  ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්...

මා වෙත සෙනෙහසින් අකුරු ලියවූ

චාමිණී පල්ලියගුරු ගුරු මෑණියන්ටත්

ආදරයෙන් පුදමි....



පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්තකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක්වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතිකඅවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20

# අසරණ ගැහැණු ළමයා

ඔන්න එකෝමත් එක කාලයක අසරණ පුංචි ගැහැණු ළමයෙක් සිටියා.

එයා ජීවත් වුණේ පුංචි ගෙදරක එයාගේ ආච්චි අම්මාත් එක්ක.



ඔන්න ඔහොම කාලයක් ගතවෙන කොට එයාගේ ආච්චි මිය ගියා.

ගැහැණු ළමයට හරිම දුකයි....



එක දවසක් අර පුංචි ගැහැණු ළමයා අඬමින් ඉන්නකොට රැස් විහිදුවමින් ලස්සනම ලස්සන සුරංගනාවියක් මතුවුණා.



ඉතින් අර සුරඟන පුංචි ගැහැණු ළමයට ලස්සන බෝනික්කෙක් දුන්නා.බෝනිකව දීලා සුරංගනාවි මෙහෙම කිව්වා...

"ඔය බෝනික්කා ඔබට උදව් කරයි"



ඔන්න එක දවසක් පුංචි ගැහැණු ළමයට  බඩගිනි හැදුණා..අර ගැහැණු ළමයා කිවුවා බෝනික්කෝ බෝනික්කෝ මට බඩගිනියි කියලා.....



බෝනික්කා රසම රස ඉදුණු පළතුරු ගෙනල්ලා දුන්නා.ගැහැණු ළමයා බඩ පිරෙනකල් කෑවා.

එයාට හරිම සතුටුයි.



ඔන්න ආයෙමත් සුරංගනාවි ආවා.


සුරඟන ඇහුවා.. ඔබ නරක වැඩ කරේ නැහැ නේද කියලා.

ගැහැණු ළමයා කිව්වා මම නරක වැඩ කරේ නැහැ කියලා.එහෙනම් හොඳයි කියලා සුරංගනාවි අතුරුදහං වුණා.



දවසක් ලේන් පැටියෙක් ගහෙන්
බිමට වැටිලා ඉන්නවා ගැහැණු ළමයා
දැක්කා.

ඉතින් එයා ලේන් පැටියව ගහෙන්
තිබ්බා.එයාට උදව් කළා...



ඉතින් සුරංගනාවි ඒක බලාගෙන හිටියා.එයා ආයෙත් ගැහැණු ළමයා ඉදිරියෙන් මතුවුණා.

එයා ගොඩක් භය වුණා...

ඉතින් ගැහැණු ළමයා හිතුවේ සුරංඟනාවිට තරහා ගිහින් කියලා.



සුරංගනාවි ඇහුවා ඇයි ඔයා භය වෙලා කියලා...

ගැහැණු ළමයා ඇහුවා ඔයාට තරහා ගිහින් නෑ නේද? කියලා.

අපොයි නැහැ අපොයි නැහැ.

මට කොහොමටවත් තරහා ගිහින් නැහැ.

මම ඔයා කළ හොඳ වැඩේ බලාගෙන හිටියේ.

ඉතින් මට සතුටු හිතුණා.

මම දුන්නු බෝනික්කා ඉන්නවද ?

ඔව් ඔව් ඒ බෝනික්කා ඉන්නවා.

ඒ වගේම එයා මට ගොඩක් උදව් කළා.

මම හොඳ වැඩ ගොඩාක් කළා.

ඔබට බොහොම ස්තුතියි ! කියලා ගැහැණු ළමයා සුරංගනාවිට කිව්වා.

අනේ ඔබ මගේ බෝනික්කාව අරගෙන යනවද?

අපොයි නැහැ...ඔබ හොඳ ළමයෙක් නිසා අරගෙන යන්නේ නැහැ.ඔබ ගැන මට ආඩම්බරයි.

එහෙනම් මම ගිහිල්ලා එන්නම් සුරංඝනාවි කිව්වා.අයෙත් සුරංඝනාවි ආවේ නැහැ.

ඔහොම කාලයක් ගත වුණා...

ගැහැණු ළමයට යාළුවෝ ගොඩක් හම්බවුණා.



එක දවසක් එයාලා සෙල්ලම් කරමින් ඉන්නකොට දැක්කා සුරංගනාවියක් බිම වැටිලා ඉන්නවා.

ගැහැණු ළමයා දැක්කා ඒ එයාට උදව් කළ සුරංගනාවිය කියලා.



ඉතින් එයා එතනට යන්න හදනකොටම මයාකාරියක් ආවා.

මායාකාරිය කිවුවා ඔයා මගේ රාත්‍රී ආහාරය අරන් යන්නේ ඇයි කියලා.

ගැහැණු ළමයයි එයාගේ යහළුවොයි මායාකාරි එක්ක සටන් කළා.



සුරංගනාවිය බේරාගත්තා.

ඒකට තමයි කියන්නේ

සමඟිය බලය වේ කියලා.



මායාකාරිගේ මැජික් යෂ්ටිය

සුරංගනාවිගේ පපුව උඩින් තිබ්බා.

ඉතින් සුරංගනාවිට පණ ආවා.

ඔන්න ඉතින් එයාලා හැමෝම

සතුටින් ජීවත් වුණා.

පුංචි ගැහැණු ළමයා තවත් අසරණ

ගැහැණු ළමයෙක් වුනේ නම්

නැහැ.....



නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔපනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 දි මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි.ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මයාමායා පුංචි ගත්කතුවරියන්ය.පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මන දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශණය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්න සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහාලේකම්
පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

ISBN: 978-624-206-762-9